# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# வருடாந்த செயலாற்றுகை அறிக்கை

# ANNUAL PERFORMANCE REPORT

# 2023

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

இலங்கை சனநாயக சோசலிசக் குடியரசின்
பகிரங்க சேவை ஆணைக்குழு

**PUBLIC SERVICE COMMISSION
OF
THE DEMOCRATIC SOCIALIST REPUBLIC**

# 2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

**ආයතනයේ නම :- රාජ්‍ය සේවා කොමිෂන් සභාව**
**වැය ශීර්ෂ අංකය:- 06.**

අන්තර්ගතය


පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 – කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

පරිච්ඡේදය06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07– අනුකූලතා වාර්තාව

# හැඳින්වීම

21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් සංශෝධිත 54(1) අනු ව්‍යවස්ථාව අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් නව දෙනෙකුගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවසමන්විත වේ. ඒ සාමාජිකයින් අතුරින් සාමාජිකයින් තිදෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් රජයේ නිලධරයින් වශයෙන් අවුරුදු පහළොවකට වැඩි පළපුරුද්දක් ඇති තැනැත්තන් වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් එක් සාමාජිකයෙකු එහි සභාපතිවරයා ලෙස පත් කරනු ලැබේ. 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසු 2023.04.17 දින නව කොමිෂන් සභාව පත් කරන ලදී.

## 1.1. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

# දැක්ම

ජාතියේ විශිෂ්ඨත්වය සඳහා කැපවූ රාජ්‍ය සේවයක්

# මෙහෙවර

සාධාරණව, විනිවිද බවින් හා සමානුකූලව මහජනයාට සේවය කිරීමට, කාර්යක්ෂම, විනයගරුක සහ තෘප්තියට පත් රාජ්‍ය සේවයක් ස්ථාපනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

# අරමුණු

උපරිම කාර්ය සාධනය පවත්වා ගනිමින් සේවාලාභීන්ගේ කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීම

## 1.2. ප්‍රධාන කාර්යයන්

**01.** ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට අදාළ කටයුතු

**02.** රජයේ සේවයේ සෑම සේවාවක් සඳහාම සේවා ව්‍යවස්ථා සහ එම සේවාවන්ගෙන් පරිබාහිර සෑම තනතුරක් සඳහාම බඳවා ගැනීම් පටිපාටි, උසස් කිරීමේ පටිපාටි හා ස්ථාන මාරු පටිපාටි සැකසීම

**03.** අනුමත සේවා ව්‍යවස්ථා/බඳවා ගැනීම් පටිපාටි/උසස්කිරීම් පටිපාටි අනුව බඳවා ගැනීම්, සේවයේ ස්ථිර කිරීම්,උසස් කිරීම්වලට අදාළ කටයුතු මෙන්ම මාණ්ඩලික නිලධාරීන්ගේ පත්කිරීම් හා උසස් කිරීම්වලට අදාල සෞඛ්‍යසේවා කමිටුවෙන් හා අධ්‍යාපන සේවා කමිටුවෙන් පනවනු ලැබ ඇති තීරණවලට එරෙහි අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම

**04.** ඉහත සඳහන් කර්තව්‍යයන් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලැබ ඇති නියෝග/තීරණවලට එරෙහිව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව කටයුතු කිරීම.

**05.** ශ්‍රේෂ්ඨාධිකරණයෙහි හා අභියාචනාධිකරණයෙහි ගොනු කරනු ලබන නඩු අයදුම්පත් සම්බන්ධයෙන් ද කටයුතු කිරීම.

**06.** රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විනය පාලනයට යටත් නිලධාරීන්ගේ විනය සම්බන්ධයෙන් කටයුතු කිරිම

**07.** බලය අභිනියෝජිත බලධරයකුගේ නියමයකින් අතෘප්තියට පත් රාජ්‍ය නිලධාරීන් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 58 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන ලිඛිත අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීම

## 1.2 සංවිධාන සටහන


කොමිෂන් සභාව
සෞඛ්‍ය සේවා කමිටුව
ලේකම්
අධ්‍යාපන සේවා කමිටුව
සෞඛ්‍ය සේවා කමිටුවේ ලේකම්
අති.ලේකම් (පාලන හා මූල්‍ය)
අති.ලේකම් (ආයතන)
අධ්‍යාපන සේවා කමිටුවේ ලේකම්
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
ප්‍රධාන ගණකාධිකාරී
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්(ආයතන)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්(අභියාචනා)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (විනය)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රතිපත්ති)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්(උසස්කිරීම්)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පත්කිරීම්)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
සහකාර ලේකම්
අභ්‍යන්තර විගණක
නීති නිලධාරී
සහකාර අධ්‍යක්ෂ තොරතුරු තාක්ෂණ
පරිපාලන නිලධාරී
තාක්ෂණ නිලධාරී
භාෂා පරිවර්තක
තොරතුරු හා තාක්ෂණ නිලධාරී
තොරතුරු හා තාක්ෂණ සහකාර
කළමනාකරණ සේවා නිලධාරී
පිළිගැනීමේ නිලධාරී
රියදුරු සේවයේ නිලධාරීන්
ජලනල/විදුලි කාර්මික ශිල්පී
කාර්යාල සේවක සේවය

**02 පරිච්ඡේදය–ප්‍රගතිය හා ඉදිරි දැක්ම**

**02.1 ප්‍රගතිය**

**02.1.1 කාර්යයන්**

එක් එක් අංශ වලින් පහත සඳහන් කාර්යයන් 2023 වර්ෂය තුල සම්පූර්ණ කර ඇත.

<u>ආයතන අංශය</u>

| | |
|---|---|
| නව බඳවා ගැනීමේ පරිපාටි | 08 |
| නව ස්ථාන මාරු පරිපාටි | 08 |
| නව උසස් කිරීම් පරිපාටි | 04 |
| බඳවා ගැනීමේ පරිපාටි සංශෝධන | 31 |
| සේවා ව්‍යවස්ථා සංශෝධන | 11 |
| ස්ථාන මාරු පරිපාටි සංශෝධන | 15 |
| උසස්කිරීම් පරිපාටි සංශෝධන | 04 |
| ප්‍රතිපත්ති සම්බන්ධ කටයුතු | 134 |
| පොදු කරුණු | 146 |
| විශේෂ අවස්ථාවන්හිදී සේවා ව්‍යවස්ථාවලින් බැහැර වීම් සම්බන්ධව කෙරෙන ඉල්ලීම් | 03 |
| විශේෂ අවස්ථාවන්හි දී බඳවාගැනීමේ පරිපාටි වලින් බැහැර වීම් සම්බන්ධව කෙරෙන ඉල්ලීම් | 15 |
| බලතල පැවරීම / පරිපාලන බලතල පැවරීම | 23 |
| නිරීක්ෂණ ලබාදීම (SCFR) | 10 |
| නිරීක්ෂණ ලබාදීම (CA Writ) | 03 |
| නිරීක්ෂණ ලබාදීම (AAT) | 12 |
| නිරීක්ෂණ ලබාදීම (Ombudman) | 01 |
| නිරීක්ෂණ ලබාදීම (අමාත්‍ය මණ්ඩලය වෙත) | 33 |
| AAT තීරණ ක්‍රියාත්මක කිරීම | 05 |
| චක්‍රලේඛ | 02 |
| එකතුව | 468 |

**<u>විනය අංශය</u>**

| | |
|---|---|
| විනය කටයුතු අවසන් කිරීම් (මූලික විමර්ශන වාර්තාවෙන් පසුව/දීර්ඝ පිළිතුරෙන් පසුව) | 04 |
| චෝදනා පත්‍ර නිකුත් කිරීම | 72 |
| චෝදනා පත්‍ර සංශෝධනය කිරීම | 15 |
| විනය පරීක්ෂණ නිලධාරීන් පත්කිරීම් | 34 |
| පරීක්ෂණ මණ්ඩලය සංශෝධනය කිරීම | 11 |
| චෝදනාවලින් නිදහස් කිරීම | 12 |
| විනය කටයුතු සම්බන්ධ උපදෙස් ලබාදීම | 56 |
| අනෙකුත් විනය දඬුවම් | 33 |
| විනය හේතු මත විශ්‍රාම ගැන්වීම් සාමාන්‍ය විශ්‍රාම ගැන්වීමක් බවට පරිවර්තනය කිරීම | 09 |
| වැඩ තහනම් කිරීම | 11 |
| වි. වැ.ව්‍ය. සංග්‍රහයේ 12 වැනි වගන්තිය යටතේ විශ්‍රාම ගැන්වීම | 10 |
| ස්ථාන මාරුකිරීම් | 06 |
| සේවයෙන් විශ්‍රාම ගැන්වීම් | 09 |
| විදේශ නිවාඩු අනුමත කිරීම | 03 |
| නැවත සේවයේ පිහිටුවීම | 07 |
| අභියාචනා ප්‍රතික්ෂේප කිරීම (අධ්‍යාපන හා සෞඛ්‍ය සේවා කමිටු සහ අධ්‍යාපන බලධාරීන් සම්බන්ධ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග සඳහා) | 18 |
| අභියාචනා සඳහා ඉඩදීම් (අධ්‍යාපන හා සෞඛ්‍ය සේවා කමිටු සහ අධ්‍යාපන බලධාරීන් සම්බන්ධ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග සඳහා) | 08 |
| අභියාචනා ප්‍රතික්ෂේප කිරීම් (සේවය හැරයාමේ නියෝග සඳහා) | 07 |
| විනය පරීක්ෂණ නිලධාරීන් සංචිතයේ ලියාපදිංචි කිරීම | 04 |
| අනෙකුත් සාමාන්‍ය නියෝග | <u>176</u> |
| | **<u>505</u>** |

## පත්කිරීම් අංශය

| | |
|---|---|
| විශ්‍රාම ගැන්වීම | 18 |
| ස්ථිර කිරීම | 414 |
| බඳවා ගැනීම | 251 |
| තනතුරට පත්කිරීම | 03 |
| රා.සේ.කො.ස.ව. 2/2022 පත්කිරීම සම්බන්ධ තීරණ | 150 |
| කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම | 369 |
| කාර්යක්ෂමතා කඩඉම් සම්බන්ධ තීරණ | 346 |
| වැඩබැලීමට / රාජකාරී ඉටුකිරීමට පත් කිරීම | 1,112 |
| මුදාහැරීම | 137 |
| ඉල්ලා අස්වීම | 78 |
| අන්තර්ග්‍රහණය කිරීම | 26 |
| වෙනත් ඉල්ලීම් - පත්කිරීම් | 207 |
| වෙනත් ඉල්ලීම් - වෙනත් | 07 |
| | **3,118** |

## උසස් කිරීම් අංශය

| | |
|---|---|
| ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීම | 1,274 |
| තෝරා ගැනීම මත උසස් කිරීම | 1,040 |
| තනතුරු වලට පත් කිරීම | 456 |
| වැඩ බැලීමට / රාජකාරී ඉටුකිරීමටපත් කිරීම (ප්‍රාදේශීය ලේකම්) | 131 |
| | **2,901** |

<u>අභියාචනා අංශය</u>

| | |
|---|---|
| 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා ලැබුණු අභියාචනා | 1,978 |
| 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා බලය අභිනියෝජිත බලධරයන් වෙතින් නිරීක්ෂණ හා නිර්දේශ සහිත වාර්තා කැඳවා ඇති අභියාචනා (පෙර වර්ෂයන්හි අභියාචනා ද ඇතුලත්ව) | 387 |
| 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා කටයුතු නිම කළ අභියාචනා (පෙර වර්ෂයන්හි අභියාචනා ද ඇතුලත්ව) | 2,014 |

<u>කටයුතු නිම කළ අභියාචනා පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.</u>

| | |
|---|---|
| විනය කරුණු සම්බන්ධ අභියාචනා | 201 |
| උසස්වීම් සම්බන්ධ අභියාචනා | 55 |
| තනතුර අතහැරයාමේ නිවේදනය සම්බන්ධ අභියාචනා | 388 |
| ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා | 1,016 |
| පත්කිරීම් සම්බන්ධ අභියාචනා | 6 |
| වැඩ තහනම් කිරීම සම්බන්ධ අභියාචනා | 69 |
| වෙනත් | 249 |
| පරිවාස පත්වීම අවසන් කිරීම | 30 |
| එකතුව | **2,014** |

මෙහෙයුම් අංශය

- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.
- ආයතනයේ ලේඛන කළමනාකරණය සඳහා සකස් කර ඇති ලේඛන කළමනාකරණ පද්ධතිය යාවත්කාලීන කිරීම් අධීක්ෂණය, එය වැඩි දියුණු කිරීම හා අඛණ්ඩ සේවාවක් ලෙස පවත්වා ගෙන යාම.
- ආයතනයේ එක් එක් අංශයන්හි කළමනාකරණ සේවා නිලධාරීන්ගේ හා මාණ්ඩලික නිලධාරීන්ගේ ප්‍රගතිය සමාලෝචනය කිරීම හා අදාළ වාර්තා ලේකම් වෙත හා කොමිෂන් සභාව වෙත යොමු කිරීම.
- ආයතනයේ වෙබ් අඩවිය යාවත් කාලීන කිරීම, කොමිෂන් සභා නියෝග වෙබ් අඩවියට ඇතුළත් කිරීම හා අන්තර්ජාලය හරහා ලැබෙන සේවාලාභීන්ගේ ඉල්ලීම් සඳහා පිළිතුරු සැපයීම.
- රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විෂය පථයට අයත් වන, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල නොවිසඳී ඇති ගැටළු විසඳීම කඩිනම් කිරීම සඳහා පවත්වනු ලබන සාකච්ඡා සම්බන්ධීකරණය කිරීම හා සාකච්ඡා සටහන් සකස් කිරීම.
- පුරවැසි ප්‍රඥප්තිය - එක් එක් අංශයන්හි කාර්යයන් කිරීම සඳහා ගත වන කාල රාමුව සකස් කිරීම.
- එක් එක් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල කාර්ය මණ්ඩල දත්ත හා පුරප්පාඩු පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම.
- පත්කිරීම්, උසස්කිරීම් හා ආයතන අංශ වෙතින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන ගොනු, අතිරේක ලේකම් (ආයතන) හරහා කොමිෂන් සභාව වෙත යොමු කිරීම හා අදාළ පරිදි ලේඛන කළමනාකරණ පද්ධතිය යාවත්කාලීන කිරීම.
- රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විෂය පථයට අයත් වන විෂය කරුණුවලට අදාළව දිනපතා පුවත්පත්වල පළ කරනු ලබන, පුවත්පත් ලිපි සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපති හා ලේකම් දැනුවත් කිරීම.

## <u>අධ්‍යාපන සේවා කමිටුව</u>

### <u>විනය</u>

| | |
|---|---|
| චෝදනා පත්‍ර නිකුත්කිරීම | 03 |
| චෝදනා පත්‍ර සංශෝධනය කිරීම | 01 |
| විශ්‍රාම ගැන්වීම (විශ්‍රාම වැටුප් සංග්‍රයේ 12 වගන්තිය යටතේ) | 14 |
| අවසන් විනය නියෝග ලබාදීම | 03 |
| විනය පරීක්ෂණ නිලධාරින් පත් කිරීම | 05 |
| පරීක්ෂණ නිලධාරීන් පත් කිරීම | 02 |
| වැඩතහනම් කිරීම | 04 |
| විනය හේතුමත විශ්‍රාම ගැන්වීම සාමාන්‍ය විශ්‍රාම ගැන්වීමක් බවට පරිවර්ථනය කිරීම | 02 |
| නැවත සේවයේ පිහිටුවීම | 04 |
| අනෙකුත් සාමාන්‍ය නියෝග | 49 |
| | **87** |

### <u>පත් කිරීම් හා උසස් කිරීම්</u>

| | |
|---|---|
| බඳවා ගැනීම් හා ඒ හා සම්බන්ධ කරුණු | 59 |
| ස්ථිර කිරීම | 136 |
| උසස් කිරීම | 482 |
| මුදා හැරීම | 21 |
| අන්තර්ග්‍රහණය කිරීම | 09 |
| කාර්යක්ෂමතා කඩඉම් සම්බන්ධ තීරණ | 110 |
| තනතුරු වලට පත් කිරීම | 66 |
| ස්ථානමාරු | 77 |
| ඉල්ලා අස්වීම | 01 |
| වැඩ බැලීම | 02 |
| රා.ප.ච. 30/88 යටතේ විශ්‍රාම ගැන්වීමට අනුමැතිය ලබාදීම | 05 |
| අනෙකුත් නියෝග | 11 |
| | **979** |

සෞඛ්‍ය සේවා කමිටුව

| | |
|---|---|
| පත්කිරීම | 2337 |
| 2017 වර්ෂයට පෙර රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරන ලද මෙතෙක් පත්වීම් ලිපි නිකුත් කර නොමැති වෛද්‍යවරුන් වෙත පත්වීම් ලිපි නිකුත් කිරීම | 37 |
| විශ්‍රාම ගැන්වීම් | 27 |
| සේවය ස්ථිර කිරීම | 867 |
| උසස් කිරීම් | 2,721 |
| මුදා හැරීම | 68 |
| ස්ථාන මාරු කිරීම | 5,349 |
| ස්ථාන මාරු කිරීම සම්බන්ධ අභියාචනා | 189 |
| කාර්යක්ෂමතා කඩඉම සම්බන්ධ තීරණ | 93 |
| සේවයෙන් ඉල්ලා අස්වීම් | 227 |
| සේවයෙන් මුදාහැරීම් | 45 |
| වැඩ බැලීම/රාජකාරි ඉටුකිරීම | 09 |
| කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් | 32 |
| II වනඋපලේඛණයහෝ ලඝුවිනය යටතේ ක්‍රියා කිරීමට අමාත්‍යාංශය වෙත යැවීම | 06 |
| චෝදනා පත්‍ර නිකුත් කිරීම | 21 |
| චෝදනා පත්‍ර සංශෝධනය කිරීම | 14 |
| විධිමත් විනය පරීක්ෂණ/පැමිණිල්ල මෙහෙයවීමේ/රැකවරණ නිලධාරීන් පත්කිරීම | 69 |
| චෝදනා වලින් නිදහස් කිරීම - විධිමත් විනය පරීක්ෂණයෙන් පසුව | 05 |
| වැඩ තහනම් කරීම | 02 |
| අනිවාර්ය නිවාඩු ගැන්වීම | 01 |
| අනිවාර්ය නිවාඩු ගන්වා නැවත සේවයේ පිහිටුවීම | 01 |
| වි.වැ.ව්‍ය.සං.12 වැනි වගන්තිය යටතේ විශ්‍රාම ගැන්වීම | 01 |
| විනය හේතු මත ස්ථාන මාරු අනුමැතිය/ ආවරණ අනුමැතිය | 01 |
| අවසන් විනය නියෝග | 73 |
| විනය කටයුතු සම්බන්ධ වෙනත් තීරණ | 96 |
| සේවය හැරයාමටඅදාලව - නැවත සේවයේ පිහිටුවීම | 12 |
| සේවය හැරයාමටඅදාලව - අභියාචනා ප්‍රතික්ෂේප කිරීම් | 01 |
| | **12,304** |

### 02.1.2 2016 අංක 12 දරණ තොරතුරු පනත යටතේ කටයුතු කිරීම

2016 අංක 12 දරණ තොරතුරු පනත යටතේ 2023 වසර තුලදී පහත ඉල්ලීම් සම්බන්ධව එක් එක් අංශ විසින්කටයුතු කර ඇත.

| අංශය | කටයුතු කර ඇති තොරතුරු ගණන |
|---|---|
| ආයතන අංශය | 38 |
| විනය අංශය | 37 |
| පත්කිරීම් අංශය | 53 |
| සෞඛ්‍ය සෙවා කමිටුව | 06 |
| එකතුව | 134 |

### 02.1.3 මහජන පෙත්සම් කාරක සභා පැමිණිලි, ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණ නඩු සහ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ අභියාචනා.

2023 වසර තුලදීඑක් එක් අංශ වලින් පහත සඳහන් නඩු සඳහා ලිඛිත නිරීක්ෂණ ලබාදී ඇති අතර පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ අභියාචනා හා මහජන පෙත්සම් කාරක සභා පැමිණිලි සඳහා පෙනී සිට ඇත.

| අංශය | ශ්‍රේෂ්ඨාධිකරණ නඩු | අභියාචනාධිකරණ නඩු | දිස්ත්‍රික් අධිකරණ නඩු | මහේස්ත්‍රාත් අධිකරණ නඩු | පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ අභියාචනා | මහජන පෙත්සම් කාරක සභා පැමිණිලි |
|---|---|---|---|---|---|---|
| ආයතන | 25 | 07 | - | - | 21 | 9 |
| විනය | 18 | 07 | 02 | 01 | 87 | - |
| සෞඛ්‍ය සේවා කමිටුව | 06 | 01 | - | - | - | - |
| පත්වීම් | 38 | 14 | - | - | 94 | - |
| උසස්කිරීම් | 28 | 05 | - | - | 82 | - |
| අභියාචනා | 58 | - | - | - | 450 | 36 |
| එකතුව | 173 | 34 | 02 | 01 | 734 | 45 |

### 02.1.4 විශේෂ ජයග්‍රහණ,

අදාල නොවේ

02.2 ඉදිරි දැක්ම

02.2.1 අභියෝග

I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන බඳවා ගැනීමේ පටිපාටි හා සේවා ව්‍යවස්ථා සැකසීම, පත්කිරීම්, උසස්කිරීම්, විනය හා අභියාචනා සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී අදාල දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ වෙතින් තොරතුරු ඉදිරිපත් කිරීමේ දී නියමිත ආකෘති මගින් හෝ නිශ්චිත පූර්ණ තොරතුරු නිසියාකාරව ඉදිරිපත් කිරීමේ දී ඇතිවන ප්‍රමාදයන් හේතුවෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණ ගැනීමේ දී ප්‍රමාදයන් ඇති වීම.

II. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 ට අනුකූලව සංශෝධිත සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පටිපාටිවලට අනුව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත පරිදි නොපැවැත්වීම නිසා අගතියට පත්වන නිලධාරීන්ට සහන සැලසීමේදී ගැටළු ඇතිවීම.

III. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණයකින් අතෘප්තියට පත් පුද්ගලයින් විසින් පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය විසින් ලබා දෙන ඇතැම් තීරණ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, ආයතන සංග්‍රහය සහ අදාල චක්‍රලේඛවල විධිවිධානවලට පටහැනි වන බැවින් එම තීරණ ක්‍රියාත්මක කිරීමේදී ගැටළුකාරී තත්ත්වයන් ඇතිවීම

IV. සේවා අවශ්‍යතාවය සහ රජයේ වියදම පිළිබඳ නිසි ඇගයීමකින් තොරව කාර්ය මණ්ඩලය ඉහල දැමීම

වැනි කරුණු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මුහුන දෙන ප්‍රධාන අභියෝග ලෙස දැක්විය හැක.

02.2.2 ඉදිරි ඉලක්ක

I. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති II කාණ්ඩය (විනය කායිපටිපාටිය පිළිබඳ රීති) සාදා නිම කිරීම.

II. රාජ්‍ය සේවයතුල තිබෙන දැනට පවතින උසස්කිරීම් ක්‍රමවේදයන් තුල ඇති, උසස් කිරීම් පෙරදාතම කිරීම් හා උසස්වීම් ලබා දීමේ ක්‍රමවේදයන්ගේ විවිධත්වය නැවත සමාලෝචනය කර එක් විධිමත් ක්‍රමවේදයක් සැකසීම.

..........................................

ප්‍ර.ග.නි./ ග.නි./ ආයතන ප්‍රධානියා

03 පරිච්ඡේදය- 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

### 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයසඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 රු. | | සටහන | තත්‍ය 2023 රු. | 2022 රු. | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවාමත බදු | 2 | - | - | |
| - | ජාත්‍යන්තර වෙළදාම මතබදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් භාවෙනත් | 4 | - | - | |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 272,282,000 | 270,607,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 314,356 | 182,467 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 15,937,170 | 13,949,867 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | මුළු ආදායම් නොවනලැබීම් (ආ) | | 288,533,526 | 284,739,334 | |
| - | මුළු ආදායම් ලැබීම්සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | 288,533,526 | 284,739,334 | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ) | | 5,000,000 | - | |
| | ශුද්ධ ආදායම් ලැබීම්සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ) | | 283,533,526 | 284,739,334 | |
| | අඩු කළා : වියදම් | | | | |
| - | පුනරාවර්තන වියදම් | | - | - | ඒසීඒ-2(ii) |
| 223,760,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 193,777,436 | 212,333,131 | |
| 93,340,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 75,550,019 | 62,593,270 | |
| 2,000,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 1,574,083 | 1,802,746 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තනවියදම් | 9 | - | - | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 319,100,000 | මුළු පුනරාවර්තනවියදම (ඊ) | | 270,901,538 | 276,729,147 | |
| | මූලධන වියදම් | | | | |
| 2,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හාවැඩිදියුණු කිරීම් | 10 | 1,496,041 | 615,004 | ඒසීඒ-2(ii) |
| 9,100,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 8,505,118 | 9,167,486 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 2,000,000 | හැකියා වර්ධනය | 14 | 1,555,700 | 630,180 | |
| - | වෙනත් මූලධන වියදම් | 15 | - | - | |
| 13,100,000 | මුළු මූලධන වියදම් (උ) | | 11,556,859 | 10,412,670 | |
| | තැන්පතු ගෙවීම් | | 360,735 | 135,176 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 13,934,912 | 6,548,467 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර්ගිණුම් ගෙවීම් | | - | - | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 14,295,647 | 6,683,643 | |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 296,754,044 | 293,825,460 | |
| - | දෙසැම්බර් 31 දිනටශේෂය ඒ = (ඉ-එ) | | (13,220,518) | (9,086,126) | |
| | අග්‍රිම ගැලපුම්ප්‍රකාශනය අනුව ශේෂය | | (13,220,518) | (9,086,126) | ඒසීඒ-7 |
| | දෙසැම්බර් 31 දිනටඅග්‍රිම ශේෂය | | | | ඒසීඒ-3 |
| | | | (13,220,518) | (9,086,126) | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

**2023 දෙසැම්බර් 31 දිනට**

**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | 2023 | 2022 |
|---|---|---|---|
| | | රු. | රු. |
| <u>මූල්‍ය නොවනවත්කම්</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 871,881,158 | 854,113,318 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 32,359,405 | 34,361,663 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **904,240,563** | **888,474,981** |
| <u>ශුද්ධ වත්කම් /ස්කන්ධය</u> | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 32,303,803 | 34,259,682 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 871,881,158 | 854,113,318 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 55,602 | 101,981 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **904,240,563** | **888,474,981** |

පිටු අංක...18....සිට ...51... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක ...52.... සිට ...59.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ.මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරන ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත්, ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍යපරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතිකකරමු.

...........................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම:
තනතුර: ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දසාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.
දිනය : 24.06.24

...........................
ප්‍රධානමූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම : 24.06.24
දිනය : කේ.රේණුකා
ගණකාධිකාරි
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | - |
| මුළු බදු ලැබීම් | | - | - |
| ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර | | - | - |
| ලාභ | | - | - |
| ආදායම් නොවන ලැබීම් | | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | 12,384,441 | 9,534,266 |
| අග්‍රිම ලැබීම් | | 272,282,000 | 270,607,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | | 10,468,034 | 11,478,834 |
| තැන්පතු ලැබීම් | | 314,356 | 182,467 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | | **295,448,831** | **291,802,567** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 262,781,794 | 275,870,123 |
| සභනාධාරසහ මාරුකිරීම් | | 1,574,083 | 1,802,746 |
| වෙනත්වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | 409,627 | 333,836 |
| භාණ්ඩාගාරයටපියවන ලද අග්‍රිම | | 5,000,000 | 0 |
| අත්තිකාරම් ගෙවීම් | | 13,773,763 | 4,511,722 |
| තැන්පතු ගෙවීම් | | 360,735 | 135,176 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | | **283,900,003** | **282,653,603** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | | **11,548,829** | **9,148,964** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |
| පොළී | | - | - |
| ලාභාංශ | | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | 8,030 | 18,522 |
| උපණය අයකර ගැනීම් | | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | | **8,030** | **18,522** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | | |
| මූලධන වියදම් | | 11,556,859 | 9,167,486 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | | **11,556,859** | **9,167,486** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)** | | **(11,548,829)** | **(9,148,964)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | | **(0)** | **(0)** |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | | |

| | | |
|---|---|---|
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | - | - |
| අඩුකළා : මුදල් වැය කිරීම් | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | - | - |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ) | (0) | (0) |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | (0) | (0) |

### 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

### 3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

| ආදයම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| | අදාල නොවේ | | | | |

### 3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 319,100 | 319,100 | 270,902 | 85% |
| ප්‍රාග්ධන | 13,100 | 13,100 | 11,557 | 88% |

### 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ ~~දෙපාර්තමේන්තු~~ වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට~~/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට~~ ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 01 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | අත්තිකාරම් බී ගිණුමේ ශේෂ නිරවුල් කිරීම | 54 | 54 | 54 | 100% |
| 02. | බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව | බහුකාර්ය සංවර්ධන සහායකයින් වෙනුවෙන් වැටුප් ගෙවීම | 356 | 356 | 356 | 100% |

**3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය**

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 2023.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 2023.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 571,439 | 571,439 | - | 100 |
| 9152 | යන්ත්‍රෝපකරණ | 219,942 | 219,942 | - | 100 |
| 9153 | ඉඩම | 80,500 | 80,500 | - | 100 |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | - | - |
| 9180 | කල්බදු වත්කම් | - | - | - | - |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. } PIC/B/PSC/2/23/ 25 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2024 මැයි 30 දින. |

ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

**ශීර්ෂය - 006 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශීර්ෂය - 006 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

3

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 05 ක හා මූලධන වැය විෂයයන් 04 ක එකතුව රු.30,130,931 ක්වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.12,295,221 ක් වශයෙන් සියයට 22 සිට සියයට 100 දක්වා ඉතිරිවීම් පැවතුණි.

**2.2 බැරකම් පිළිබඳ ප්‍රකාශය**

2024 වර්ෂයේ ජනවාරි හා පෙබරවාරි මාසවල ගෙවීම් කර තිබුණු එකතුව රු.1,457,443 ක්වූ 2023 වර්ෂයට අදාල වැය විෂයයන් 03 ක බැරකම් මු.රෙ.94 (2) සහ (3) ප්‍රකාරව බැරකම්වලට එළඹෙන ලද බැඳීම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි. ඉන් එක් වැය විෂයයක ප්‍රතිපාදන ඉතිරිය ඉක්මවීම රු.58,280 ක් වී තිබුණි.

**3 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතින්හි 237 වන වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාව වෙත යොමුකළ අභියාචනයක් කොමිෂන් සභාව වෙත ලැබී, ස්ථාන මාරු සම්බන්ධයෙන් දින 15 ක් හා උසස් කිරීම් සම්බන්ධයෙන් දින 45 ක් ඇතුළත තීරණයක් කොමිෂන් සභාව විසින් ගනු ලැබිය යුතු වේ. එසේ වුවද නියැදි පරීක්ෂාවට ලක් කරන ලද 2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලයේදී ලැබුණු ඉල්ලීම් වලට අදාල අභියාචනා ලිපිගොනු 10 කින් ලිපිගොනු 04 කට අදාල තීරණ 2024 ජනවාරි 22 දින වන විටත් ලබාදී නොතිබුණු

අතර තීරණ ලබාදී තිබූ ලිපිගොනු 06 ක් සඳහා තීරණ ලබාදීමට අවුරුදු 01 සිට අවුරුදු 07 ක කාලයක් ගත කර තිබුණි.

(ආ) 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති අවලංගු කර නිකුත් කර තිබූ 2022 පෙබරවාරි 14 දිනැතිවා අංක 2310/29 දරන කාර්ය පටිපාටික රීතීන්වල උසස් කිරීම් සම්බන්ධයෙන් ලැබෙන අභියාචනා සඳහා තීරණ ලබා දීමේ කාලසීමාව දක්වා නොතිබුණි.

(ඇ) කොමිෂන් සභාවේ විනය පාලනයට යටත් නිලධාරීන්ගේ විනය සම්බන්ධයෙන් කටයුතු කිරීම කොමිෂන් සභාවේ එක් ප්‍රධාන කාර්යයක් වන අතර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLXIII පරිච්ඡේදය සම්බන්ධයෙන් නිකුත් කර ඇති 30/2019 දරන හා 2019 සැප්තැම්බර් 30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව විධිමත් විනය පරීක්ෂණයක් ආරම්භ කර මාස 06 ක් ඇතුළත එය නිම කළ යුතු බව සඳහන් වුවද නියැදි විගණන පරීක්ෂණයට ලක් කළ විනය කටයුතු 08 ක එම ඉල්ලීම් ලැබී වසර 02 සිට වසර 04 දක්වා කාලයක් ගතවී තිබුණද 2024 පෙබරවාරි 24 දින වන විටත් එම විනය කටයුතු අවසන්ව නොතිබුණි.

### 3.2 වත්කම් කළමනාකරණය

කොමිෂන් සභාව සතු පිරිවැය රු.2,850,000 ක්වූ වාහනයක් 2020 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2024 මාර්තු 27 දින දක්වා ධාවනයෙන් තොරව පැවතුනි.

### 3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව, ආයතන අංශය, විනය අංශය, පත්කිරීම් අංශය හා උසස් කිරීම් අංශය විසින් 2023 වර්ෂයේ සිදු කරන ලද කාර්යයන් සංඛ්‍යාව පමණක් කාර්යසාධන වාර්තාවේ ඇතුළත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ අංශයට ලැබුණු පැමිණිලි සංඛ්‍යාව, එම පැමිණිලි තුළින් නිම කළ ප්‍රමාණය සහ තවදුරටත් ඉතිරිව පවතින ප්‍රමාණය යන තොරතුරු ඇතුළත් කර නොතිබුණි. ඒ අනුව 2023 කාර්යසාධන වාර්තාව තුල 2023 වර්ෂයේ කාර්ය සාධන මට්ටම සලකා බැලීමට තරම් ප්‍රමාණවත් කරුණු ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2023 වර්ෂයේ අභියාචන අංශයට ලැබුණු අභියාචනා ප්‍රමාණය ප්‍රමාණාත්මකව දක්වා තිබුණද, නිරීක්ෂණ හා නිර්දේශ සහිත වාර්තා කැඳවූ අභියාචනා ගණන සහ කටයුතු නිම කළ අභියාචනා ප්‍රමාණය ඉදිරිපත් කිරීමේදී එය සමාලෝචිත වර්ෂයේ සහ පෙර

5

වර්ෂයන්හි අභියාචනා ප්‍රමාණයද ඇතුළත්ව ඉදිරිපත් කර තිබුණු අතර එහි කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි. එම හේතුවෙන්, එම අංශයේ සමාලෝචිත වර්ෂයේ කාර්යසාධන මට්ටම නිශ්චය කිරීමට ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) 2023 ක්‍රියාකාරී සැලැස්මේ ඉටු කිරීමට අපේක්ෂිත එක් එක් කාර්යයන්වල ඉලක්ක හෝ ලැබී තිබූ කාර්යයන් ප්‍රමාණය සඳහන් කර නොතිබියදී කාර්යසාධන දර්ශක යටතේ අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස තත්‍ය නිමැවුම සියයට 100 ත් සියයට 90 ත් අතර ප්‍රතිශතයක් දක්වා තිබීම ගැටලුකාරී විය.

3.4 කළමනාකරණ දුර්වලතා

(අ) විනය පරීක්ෂණයක් සඳහා පත් කර තිබුණු පරීක්ෂණ නිලධාරියකු විසින් පරීක්ෂණ සැසි 03 ක් පවත්වා පරීක්ෂණ කටයුතු වලින් ඉවත්වී තිබුණු අතර පසුව නව විනය පරීක්ෂණ නිලධාරියකු පත් කර විනය පරීක්ෂණ කටයුතු මුල සිට ආරම්භ කර තිබියදී සිදු කළ විනය පරීක්ෂණ සැසිවාර 03 වෙනුවෙන් පෙර පරීක්ෂණ නිලධාරියාට කොමිෂන් සභාව විසින් රු.20,252 ක් ගෙවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගැනීමට සැලසුම් කරන එක් එක් ප්‍රසම්පාදන අයිතම වර්ගය ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර නොතිබුණු අතර අයවැය ඇස්තමේන්තුවේ එක් එක් මූලධන වැය විෂයය හා ඒ යටතේ සඳහන් අයවැයගත මුදල දක්වා තිබුණි. තවද සැලැස්මේ සේවා යටතේ සනීපාරක්ෂක සේවා හා ආරක්ෂක සේවා සඳහා ඇස්තමේන්තුගත වියදම දක්වා නොතිබුණි.

4. සභාපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා සුදුසු විගණකවරයකු පත් කරනු ලැබිය යුතු වුවත්, 2023 ඔක්තෝබර් 03 දින සිට අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවතුනි.

5. මානව සම්පත් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2019 ජනවාරි 28 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරගෙන තිබූ තාක්ෂණ නිලධාරි තනතුරු දෙකක් සඳහා 2024 පෙබරවාරි 29 දින වන විටත් නිලධාරීන් පත් කර නොතිබුණි.

(ආ) විගණිත දිනය වූ 2024 ජනවාරි 19 දිනට කොමිෂන් සභාවේ තත්‍ය කාර්ය මණ්ඩලය 219 ක් විය. ඉන් නිලධාරීන් 84 කගේ කොමිෂන් සභාවේ සේවා කාලය වසර 05 ක්ද නිලධාරීන් 15 කගේ කොමිෂන් සභාවේ සේවා කාලය වසර 10 ක්ද ඉක්මවා තිබුණි.

H.P.S.

එච්.එස්.එස්.පෙරේරා

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට.

එච්.එස්.එස්. පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය
බත්තරමුල්ල

7

**04 පරිච්ඡේදය–කාර්ය සාධන දර්ශක**

**4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)**

**පාලන අංශය**

| ක්‍රියාකාරී සැලැස්ම අනුව ක්‍රියාව | විශේෂිත දර්ශක | සත්‍ය නිමැවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස | | |
|---|---|---|---|---|
| | | 100-90% | 75%-89% | 50%-74% |
| දෛනික තැපැල කළමණාකරණය කිරීම | දෛනික තැපැලෙන් ලැබෙන ලිපි සංඛ්‍යාව | ✓ | | |
| වාහන හා ප්‍රවාහන පහසුකම් සම්බන්ධ කටයුතු | වාහන හා ප්‍රවාහන පහසුකම් සැපයීම සම්බන්ධව නිකුත්කළ ලිපි සංඛ්‍යාව/ගනු ලැබූ ක්‍රියාමාර්ග | ✓ | | |
| | අළුත්වැඩියා කිරීමට අවශ්‍යවන වාහන සංඛ්‍යාව/ අළුත්වැඩියා කරන ලද වාහන සංඛ්‍යාව | ✓ | | |
| | රාජකාරි සඳහා ඉල්ලුම්කරන ලද වාහන සංඛ්‍යාව/ලබාදුන් වාහන සංඛ්‍යාව | ✓ | | |
| කාර්යාල ගොඩනැගිල්ල සම්බන්ධ කටයුතු | නඩත්තු හා අළුත්වැඩියා සම්බන්ධව නිකුත්කළ ලිපි සංඛ්‍යාව/ ගනු ලැබූ ක්‍රියාමාර්ග | ✓ | | |
| | ගොඩනැගිල්ල සම්බන්ධයෙන් අවශ්‍ය අළුත්වැඩියා සංඛ්‍යාව/ සිදුකරන ලද අළුත්වැඩියා කටයුතු සංඛ්‍යාව | ✓ | | |
| කාර්යාලයේ අත්‍යාවශ්‍ය සේවාවන් සඳහා ගෙවීම් කිරීම | කාර්යාලයේ අත්‍යාවශ්‍ය සේවාවන් සඳහා සකස්කරන ලද වවුචර් සංඛ්‍යාව. | ✓ | | |
| පුද්ගලික ලිපි ගොනු පවත්වාගෙන යාම | පුද්ගලික ලිපිගොනු හා සම්බන්ධව නිකුත්කළ ලිපි සංඛ්‍යාව / ගනු ලැබූ තීරණ සංඛ්‍යාව | ✓ | | |
| ආයතනයේ වාර්තා සකස් කිරීම | ආයතනය වෙනුවෙන් සකස් කරන ලද වාර්තා සංඛ්‍යාව | ✓ | | |
| ණය සම්බන්ධ කටයුතු | කටයුතුකරන ලද ණය අයදුම්පත් සංඛ්‍යාව | ✓ | | |
| කාර්යාලීය හැඳුනුම් පත් නිකුත් කිරීම | නිකුත්කරන ලද හැඳුනුම්පත් සංඛ්‍යාව | ✓ | | |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අනුකූලව කටයුතු කිරීම | RTI පනත යටතේ තොරතුරු ලබාගැනීම සඳහා ඉදිරිපත් වූ අයදුම්පත් සංඛ්‍යාව | ✓ | | |
